# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

දෙවන වාර පරීක්ෂණය **2018**
முதலாம் தவணைப் பரீட்சை 2018
**Second Term Test 2018**

11 ශ්‍රේණිය
தரம் **11**
**Grade 11**

පුරවැසි අධ්‍යාපනය I
குடியியற் கல்வி I
**Citizenship Education**

පැය 1
1 மணி
***One hour***

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

(01) රටක මූලික නීතිය වන්නේ,

1. සිවිල් නීතියයි.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.
3. අපරාධ නීතියයි.
4. ජාත්‍යන්තර නීතියයි.

(02) ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ විශේෂ ලක්ෂණය වන්නේ,

1. විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබීමය.
2. ව්‍යස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වීම
3. විධායකය, ව්‍යවස්ථාදායකයට වගකීමට ඍජුව බැඳී නොමැති වීම.
4. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සබඳතාවක් පැවතීම.

(03) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වෙත පරිපාලන බලතල පවරා දීම සිදුවන්නේ,

1. පළාත් පාලන පනතක් මගිනි.
2. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගිනි.
3. පළාත් සභා පනතක් මගිනි.
4. පාර්ලිමේන්තු පනතක් මගිනි.

(04) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි පළාත් සභාවක මහ ඇමතිවරයා ඇතුළුව අමාත්‍ය මණ්ඩලය

1. පස් දෙනෙකුගෙන් සමන්විත වේ.
2. හතර දෙනෙකුගෙන් සමන්විත වේ.
3. හය දෙනෙකුගෙන් සමන්විත වේ.
4. හත් දෙනෙකුගෙන් සමන්විත වේ.

(05) ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක එක් වී සෑදෙන පළාත් සභාව කුමක් ද?

1. දකුණු පළාත  2. වයඹ පළාත

3. ඌව පළාත  4. බස්නාහිර පළාත

(06) යහ පැවැත්ම සඳහා පුරවැසියා විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයක් නොවන්නේ,

1. සමානාත්මතාවය  2. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම

3. සාමූහිකත්වය වර්ධනය කිරීම  4. තම ආගමික වැඩ සටහන් පමණක් ක්‍රියාත්මක කිරීම.

(07) ව්‍යවසායකත්වය සඳහා කරනු ලබන ගෙවීම වන්නේ,

1. ලාභය  2. පොළිය  3. බදු කුළිය  4. වැටුප

(08) සමාජවාදී ආර්ථිකයක මූලික ලක්ෂණයක් නොවන්නේ,

1. දේපළ අයිතිය රජය සතු වීම

2. තරඟකාරි වෙළඳපොලක් පැවතීම

3. මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙය වීම.

4. මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී පොදු යහපත උදෙසා කටයුතු කිරීම

(09) ගැටුම් ඇති වන මූලයක් ලෙස සමාජ ආර්ථිකයට බල පෑ උදාහරණයක් වන්නේ,

1. දකුණු අප්‍රිකාවේ වර්ණ භේද ගැටුම්

2. කුරුස යුද්ධය

3. සෝමාලියා ඉතියෝපියා ගැටුම

4. ඊශ්‍රායල - පලස්තීන ගැටුම

(10) දෙපාර්ශවයට ම "ජය - ජය " විසඳුම් ලැබීම,

1. කේවල ක්‍රමයේ ලක්ෂණයකි.  2. මැදිහත්කරණයේ ලක්ෂණයකි.

3. විනිසීමේ ලක්ෂණයකි.  4. සාකච්ඡා ක්‍රමයේ ලක්ෂණයකි.

(11) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වන්නේ,

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.  2. රෝම ලන්දේසි නීතියයි.

3. අපරාධ නීතියයි.  4. සිවිල් නීතියයි.

(12) මුස්ලිම් නීතියට අනුව නඩු විසඳීම සඳහා පළමුවරට කාති උසාවි පිහිට වූ වර්ෂය දැක්වෙන පිළිතුර තෝරන්න.

1. ක්‍රි.ව.1706  2. ක්‍රි.ව. 1806

3. ක්‍රි.ව. 1929  4. ක්‍රි.ව. 1960

(13) ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A. පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය

B. ප්‍රාථමික මහේස්ත්‍රාත් හා දිසා අධිකරණ තීන්දුවල අභියාචනා විසඳීම

C. ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය

D. පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ අධිකරණ බලය

1. A හා C 2. A හා E 3. B හා D 4. D හා E

(14) දිසා විනිසුරුවන් පත් කිරීම හා ඉවත් කිරීම සිදු කරනු ලබන්නේ,

1. අධිකරණ සේවා කොමිසම මගිනි
2. ජනාධිපති විසිනි
3. අධිකරණ ඇමතිවරයා විසිනි
4. දිසා අධිකරණය මගිනි

(15) පුරවැසියකුට සිය මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට බලය හිමි අධිකරණය වන්නේ,

1. මහාධිකරණය 2. ශ්‍රේෂ්ඨාධිකරණය
3. අභියාචනාධිකරණය 4. මහේස්ත්‍රාත් අධිකරණය

(16) අධිකරණ සේවා කොමිසමේ සභාපති වන්නේ,

1. නීතිපතිවරයා ය. 2. අගවිනිසුරුවරයාය
3. අධිකරණ ඇමතිවරයාය. 4. ජනාධිපතිවරයාය.

(17) නීතිපති තුමාගේ බලතල හා කාර්යය ඉටු කිරීම සඳහා සහාය වන නිලධාරියෙක් නොවන්නේ,

1. සොලිස්ටර් ජනරාල් 2. රජයේ ජ්‍යෙෂ්ඨ අධි නීතිඥවරයෙක්
3. අධිකරණ සේවා කොමිසමේ සභාපති 4. රජයේ අධි නීතිඥවරයෙක්

(18) බේරුම්කරණයේ දී ආරවුල් පිළිබඳ වාර්තාවක් ලබා දෙනුයේ,

1. කම්කරු කොමසාරිස් විසින් බේරුම්කරුට ය.
2. නීතිඥවරයෙක් විසින් අග විනිසුරුවරයාට ය.
3. බේරුම් කරු විසින් නීතිඥවරයෙකුට ය.
4. විනිසුරුවරයෙක් විසින් නීතිපතිවරයා වෙත ය.

(19) මානව හිමිකම් කොමිසමේ සාමාජිකයන් ගණන වන්නේ,

1. 20 කි. 2. 30 කි. 3. 32 කි. 4. 50 කි.

(20) සාමදාන විනිශ්චකාරවරුන් පත් කිරීමේ බලය ඇත්තේ,

1. අධිකරණ ඇමතිවරයා මගින් 2. පාර්ලිමේන්තුව මගිනි
3. නීතිපති දෙපාර්තමේන්තුව මගිනි. 4. අග විනිසුරුතුමා මගිනි.

(21) 1833 කෝල්බෘක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ව්‍යවස්ථා සභාවේ නිල ලත් සාමාජික සංඛ්‍යාව

1. 06 කි. 2. 15 කි. 3. 09 කි. 4. 21 කි.

(22) බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් අග්‍රාණ්ඩු ධූරයක් ඇති කළේ,

1. 1910 කෲව් මැකලම් ආණ්ඩු ක්‍රමයෙනි.
2. 1921 මැනිං ආණ්ඩු ක්‍රමයෙනි.
3. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙනි.
4. 1947 සොල්බරි ආණ්ඩු ක්‍රමයෙනි.

(23) 1978 දෙවන ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් සිදුකරන ලද ප්‍රධානතම වෙනස්කම වන්නේ,

1. සමානුපාතික නියෝජනය හඳුන්වා දීමයි.
2. ජනමත විචාරණ ක්‍රමය හඳුන්වා දීමයි.
3. විධායක ජනාධිපති ධූරය ඇති කිරීමයි.
4. පළාත් සභා ක්‍රමය හඳුන්වා දීමයි.

(24) ශ්‍රී ලංකාවේ බලය බෙදීම පිළිබඳව අදහස ක්‍රියාවට නැංවීමට ගත් උත්සාහයන්

1. 1928 ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව
2. 1939 පළාත් සභා ආඥාපනත
3. 1956 නගර සභා ආඥාපනත
4. 1934 ගම් සභා පිහිටු වීම

(25) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්ය අතුරෙන් පොදු උපයෝගීතා සේවාවලට අයත් නොවන කාර්ය වන්නේ,

1. පොදු ස්ථානවලට විදුලිය ලබා දීම
2. මහජන වෙළඳ පොළ පවත්වා ගෙන යාම
3. මහජන වැසිකිළි ඉදි කිරීම හා නඩත්තු කිරීම
4. පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යෑම

(26) සුළු නගර සභා පිහිටුවීම සිදු වූයේ,

1. 1939 ආඥා පනත යටතේ ය.
2. 1956 ආඥා පනත යටතේ ය.
3. 1865 මහ නගර සභා ආඥා පනත යටතේ ය.
4. 1934 ආඥා පනත යටතේ ය.

(27) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකයේ බලතල හා කාර්යයක් නොවන්නේ,

1. නීති පැනවීම 2. අයවැය පාලනය
3. රාජ්‍ය සේවය පාලනය 4. දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම

(28) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නිල කාලය

1. වසර 5 කි.
2. වසර 6 කි.
3. වසර 4 කි.
4. වසර 7 කි.

(29) දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහ නගර සභා ගණන

1. 22 කි.
2. 23 කි.
3. 41 කි.
4. 50 කි.

(30) වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන සඳහා නම් නියම කිරීමේ බලය ඇත්තේ,

1. අගමැතිවරයාට ය.
2. ජනාධිපතිවරයාට ය.
3. මහ ඇමතිවරයාට ය.
4. විෂය භාර ඇමතිවරයාට ය.

(31) ප්‍රාදේශීය සභා සීමාව බොහෝ විට සීමා වන්නේ,

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රදේශයට ය.
2. පළාත් සභා බල ප්‍රදේශයට ය.
3. ග්‍රාම සේවා කොට්ඨාසයට ය.
4. නගර සභා බල ප්‍රදේශයට ය.

(32) පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල ප්‍රයෝජනයක් වන්නේ,

1. වෙළඳපල පවත්වාගෙන යෑම
2. ජල සම්පාදනය
3. සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සැකසීම
4. පොදු නාන ස්ථාන සැකසීම

(33) ආණ්ඩුවේ විවිධ ස්ථරයන් කෙරෙහි පුරවැසියන්ගෙන් ඉටු විය යුතු යුතුකමක් නොවන්නේ,

1. ජාතික අභිමානය ඉහළ දැමීම
2. නීතිය හා සාමය ආරක්ෂා කිරීම
3. ඵලදායී ජීවන වෘත්තිය හා නියැලීම
4. සමාජ සංහිඳියාව ඇති කිරීම

(34) පළමුවන ලෝක යුද්ධය පැවති කාලය වන්නේ,

1. ක්‍රි.ව. 1914 - 1918 දක්වාය.
2. ක්‍රි.ව. 1918 - 1926 දක්වාය.
3. ක්‍රි.ව. 1926 - 1939 දක්වාය.
4. ක්‍රි.ව. 1939 - 1945 දක්වාය

(35) 1948 පෙබරවාරි 10 දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කර ගනු ලැබුයේ,

1. එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය විසිනි.
2. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසිනි.
3. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසිනි.
4. එක්සත් ජාතීන්ගේ භාරකාර මණ්ඩලය විසිනි.

(36) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් සඳහන් කර ඇති පරිච්ඡේදය

1. iv වන පරිච්ඡේදය 2. iii වන පරිච්ඡේදය
3. v වන පරිච්ඡේදය 4. 12 වන පරිච්ඡේදය

(37) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සඳහන් වගන්ති ගණන,

1. 30 කි. 2. 35 කි. 3. 38 කි. 4. 40 කි.

(38) ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකමක් වන්නේ,

1. වහල් භාවයෙන් දුගී භාවයෙන් නිදහස් ව සිටීමට ඇති අයිතිය
2. සිතීමේ හෘද සාක්ෂියේ හා ආගමික නිදහස
3. නිවාඩු ලබා ගැනීමේ හා විවේක ගැනීමේ අයිතිය
4. විදේශ ගත ආරක්ෂාව ලැබීමේ අයිතිය

(39) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම විශේෂ අරමුණු 4 ක් පදනම් කරගෙන සිදු වේ. එම අරමුණු නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

1. පැවැත්ම, ආරක්ෂාව, සංවර්ධනය, සෞඛ්‍යය
2. අධ්‍යාපනය, සෞඛ්‍යය, පැවැත්ම, ආරක්ෂාව
3. සෞඛ්‍යය, ආරක්ෂාව, අධ්‍යාපනය, ආගම
4. ආරක්ෂාව,පැවැත්ම, සංවර්ධනය, සහභාගිත්වය

(40) "කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය. " ඉහත සඳහන් ප්‍රකාශය ඉදිරිපත් කළේ

1. හැරල්ඩ් ලැස්කිය. 2. ජීන් ජැක්වින් රූසෝය.
3. ගානර් ය. 4. A. V ඩයිසිය.

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය**2018** | 11 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை 2018 | தரம் **11** |
| **Second Term Test 2018** | **Grade 11** |

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය II | පැය 2 |
| குடியியற் கல்வி **II** | 2 மணி |
| **Citizenship Education** | ***Two hour*** |

**සැලකියයුතුයි:**

**(i) පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**

**(ii) පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

---

(01) (i) ග්‍රීසියේ පෞර රාජ්‍යයේ පුරවැසි සභාවේ පාලන කටයුතු සඳහා සහභාගි නොවූ කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(ii) ඒකීය ආණ්ඩු ක්‍රම පවතින රටවල් දෙකක් ලියන්න.

(iii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බල පෑ සංක්‍රමණ සාධකයන් දෙකක් සඳහන් කරන්න.

(iv) දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම සඳහා සාමාජිකත්වය දරණ රටවල් දෙකක් නම් කරන්න.

(v) ගැටුම් වර්ග පුළුල් ලෙස බෙදිය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර දෙක ලියන්න.

(vi) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් විශේෂ නීති වර්ග දෙකක් සඳහන් කරන්න.

(vii) දිසා අධිකරණවලට විසඳිය හැකි නඩු දෙකක් ලියන්න.

(viii) 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න.

(ix) සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක නම් කරන්න.

(x) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න. (2x10 = 20)

(02) (i) බලය විමධ්‍යගත කිරීමේ ස්වරූප දෙක ලියන්න. (ලකුණු 02)

(ii) ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ 3 ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක ලියන්න. (ලකුණු 02)

(ii) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලියේ ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) (a) ධනවාදී ආර්ථිකයක මූලික ලක්ෂණ 2 ක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථ ක්‍රමයෙහි ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

(ලකුණු 05)

(04) (i) නීතියේ මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) නීතියේ ආධිපත්‍යය තුළ තහවුරු වී තිබෙන සමාජයෙහි දැකිය හැකි ලක්ෂණ තුනක් ලියා, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) ශ්‍රී ලංකාවේ පහත සඳහන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සිදු වූ වර්ෂ අනුපිළිවෙලින් දක්වන්න.

A - කෝල්බෲක් ප්‍රතිසංස්කරණය

B - කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය (ලකුණු 02)

(ii) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ඇති කළ වෙනස්කම් 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) A – 1972 ව්‍යවස්ථාවේ නවාංග 03 ක් ලියන්න.

B – 1978 ව්‍යවස්ථාවේ නවාංග 2 ක් ලියන්න. (ලකුණු 05)

(06) (i) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් ඓතිහාසික අවස්ථා 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා 3 ක් සඳහන් කරන එයින් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) පරිසර පද්ධතිය සකස් වී ඇති ප්‍රධාන සංරචක දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පරිසරයෙන් ලැබෙන සේවා ප්‍රධාන කොටස් තුනකි. එම කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ජලය දූෂණය වීමෙන් ඇති වන ගැටලු 03ක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)